(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 21.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2023 මැයි 09 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1540/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත්වල සිටින අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදකයන් බහුල වශයෙන් සිටින ප්‍රදේශ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති අත්යන්ත්‍ර රෙදිපිළි අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අලෙවිසැල් බහුල වශයෙන් ඇති ප්‍රදේශ කවරේද;

(v) අත්යන්ත්‍ර රෙදිපිළි අලෙවි කිරීමෙන් එක් එක් පළාත් සභා බලප්‍රදේශය තුළ උත්පාදනය කරන වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1576/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ධාවන බලපත්‍ර නිකුත් කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) සාමාන්‍ය මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා මේ වනවිට නිකුත් කර ඇති ධාවන බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට නිකුත් කර ඇති බලපත්‍ර වෙනත් පාර්ශ්වයකට පැවරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1614/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර නගරයේ, අහිතකර වායු සංයුතිය, සම්මත සාන්ද්‍රණවලට වඩා ඉහළ අගයක් ගන්නා බව පර්යේෂණ වාර්තාවලින් තහවුරු වී ඇති බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී, අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් වායු සම්පත් කළමනාකරණ වැඩසටහන් ආරම්භ කරන ලද බවත්;

(iii) පසුව එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නවතා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එම වැඩසටහන් නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1631/2023

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉඩම් විශාල ප්‍රමාණයක් අනවසරයෙන් අත්පත්කර ගෙන ඇති බව දන්නේද;

(iii) එසේ අනවසරයෙන් අත්පත්කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(iv) එම ඉඩම්, නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සන්තකයට ලබා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1634/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(iii) අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන විසින් වාර්ෂිකව ගිණුම් වාර්තා ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1673/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැති යුදමය තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වූ දමිළ ජනතාව දහස් ගණනක් ඉන්දියාවට සංක්‍රමණය වී එහි කඳවුරු තුළ හා පිටත රැඳී සිටින බවත්;

(ii) මේ වනවිට යුදමය තත්ත්වය අවසන් වී ඇතත්, ඉහත පිරිසෙන් ආසන්න වශයෙන් 100,000ක පමණ පිරිසක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව සිටින බවත්;

(iii) ඉහත සඳහන් ජනතාව අතරින් කඳවුරුවලින් පිටත ස්ථානවල ජීවත්වන බොහෝ පිරිසකට ඉන්දීය රජය විසින් වීසා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් ඔවුන් ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේදී ඉන්දියාවේ ජීවත් වූ මුළු කාලය සඳහාම වීසා බලපත්‍ර ගාස්තු ගෙවීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ජනතාව නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1754/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන ප්ලාස්ටික් කොසු, ප්ලාස්ටික් ඉදල් හා පිරිසිදු කිරීමට යොදා ගනු ලබන ප්ලාස්ටික් බුරුසු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොහු ආශ්‍රිත භාණ්ඩ භාවිතය දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) කොහු ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ආදේශක භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1800/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති සමුපකාර ප්‍රාදේශීය වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රාදේශීය වෙළඳසැල්වල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෙළඳසැල් සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සපයනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1809/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෑලියගොඩ, විජය කුමාරණතුංග ක්‍රීඩාංගණය පෑලියගොඩ නගර සභාව විසින් පාලනය කරනු ලබන බවත්;

(ii) එම ක්‍රීඩාංගණයේ ආරක්ෂිත යකඩ ගේට්ටු පරණ යකඩවලට විකුණා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සිදුවීම සම්බන්ධයෙන් චෝදනා එල්ලවී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2529/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව රැකියා 100,000 ක් ලබාදීමේ වැඩසටහන යටතේ වර්ෂ 2020 සිට 2021 දක්වා රැකියා ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට ලබා දී නොමැති ඉතිරි රැකියා සංඛ්‍යාව ලබා දීමේ යාන්ත්‍රණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන යටතේ රැකියාලාභීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සිංහල, දෙමළ හා මුස්ලිම් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැඩසටහන යටතේ නැගෙනහිර පළාතේ රැකියාලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) නැගෙනහිර පළාතේ රැකියාලාභීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රැකියාලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 සිට 15 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/76 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.04 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 28 දිනැති අංක 2325/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 අප්‍රේල් 03 දිනැති අංක 2326/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 නොවැම්බර් 30 දිනැති අංක 2308/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 04 දිනැති අංක 2313/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 25 දිනැති අංක 2316/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 පෙබරවාරි 20 දිනැති අංක 2320/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 04 දිනැති අංක 2321/76 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 07 දිනැති අංක 2322/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 07 දිනැති අංක 2322/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 17 දිනැති අංක 2323/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 අප්‍රේල් 06 දිනැති අංක 2326/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.28 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 අප්‍රේල් 06 දිනැති අංක 2326/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.28 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ නියෝග,— 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 43 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.27 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 1),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3)(අ) සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ඩ) වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 2),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) සහ 117 (3) වගන්ති යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2ඇ, 5 සහ 5අ වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 08 දිනැති අංක 2292/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*25.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

26.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

සහන ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

රුහුණු උදානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

"මාතර සමය" සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

46.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

47.

මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

48.

දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

49.

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

50.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

51.

විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

52.

වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

53.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

54.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***